# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
# Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය — පැය 01 යි
கண்டுபிடிப்பு சோதனை — 01 மணி நேரம்
Diagnostic Test — 0 1 Hour

සිංහල භාෂාව හා සාහිත්‍යය — 11ශ්‍රේණිය
சிங்கள மொழி மற்றும் இலக்கியம் — தரம் 11
Sinhala Language and Literature — Grade 11

**සැලකිය යුතුයි.**

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් , ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

❖ අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන අදහස තෝරන්න.

01. මුළු නගරයම **දෙවනත් කරමින්** බැලුවද සොරුන් අල්ලා ගැනීමට නගරාධිපතිට නොහැකි විය.

1) ප්‍රශ්න කරමින් 2) හැමතැනම පරීක්ෂා කරමින්
3) නගරය වට කරමින් 4) දෙකඩ කරමින්

02. පියසේන බෝවන රෝග පිළිබඳව **හුඹස් බියක්** ඇති කර ගත්තේය.

1) අස්ථාන බියක් 2) දැඩි පිළිකුලක්
3) කනගාටුවක් 4) කුතුහලයක්

03. ආගම **දඩමීමා කරගත්** ඇතැම් මිනිස්සු සමාජය නොසන්සුන් කරති.

1) හඳුනා නොගත් 2) තේමාව කරගත්
3) අයුතු ලෙස යොදා ගත් 4) ඉලක්ක කර ගත්

❖ අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු පදය තොරන්න.

04. අතීත හෙළ විරුවෝ තම මවුබිමේ ___________ වෙනුවෙන් සාගර බඳු වැව් තැනූහ.

1) උන්නතිය 2) පරිණතිය
3) සම්මුතිය 4) පරිණාමය

05. මාර්ග ධාවන තරගයට ඉදිරිපත් වන සියල්ලෝම වෛද්‍ය නිලධාරීන්ගේ ___________ ලක් වූහ.

1) විමර්ශනයට 2) අධීක්ෂණයට
3) ගවේෂණයට 4) නිදර්ශනයට

06. පුවත්පත්වල සඳහන්  ‘කොවිඩ් රෝගය ‘ පිළිබඳ විස්තර _________ අවධානයට ලක්විය.

1) ශ්‍රාවකයන්ගේ 2) ප්‍රේක්ෂකයන්ගේ

3) පාඨකයන්ගේ 4) දේශකයන්ගේ

07. අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.

1) ඊශ්වර , ඉෂාරා,අමායා, ඇන් 2) දම්මි , ගයානි , ටෙහාර , කසුන්

3) කුමාරි , චමින්ද , ජයනි , සනුල 4) චමිඳු , කස්තුරි , මදුරා , රංජනි

08. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තොරන්න.

1) කොට්ඨාසය , ප්‍රස්තාවනාව , අත්‍යවශ්‍ය , ප්‍රාසාංගික

2) සාමාර්ථ්‍යය , මජ්ඣිම නිකාය , නිත්‍යානුකූල , හෘදය

3) ශීඝ්‍රගාමී , ශල්‍යාගාරය , විශ්ලේශණය , කනිෂ්ඨ

4) ආශ්වාදය , ස්වභාවික , පරිසණකය , කැලණිය

09. යංශය , රකරාංශය , රේඵය සහ ඇලපිල්ල අනුපිළිවෙළින් යෙදී ඇති උත්තරය තෝරන්න.

1) කාසිය , සත්‍ය , මිත්‍රයා , ධර්‍මය

2) සත්‍ය , මිත්‍රයා , ධර්‍මය , කාසිය

3) කාසිය , මිත්‍රයා , සත්‍ය , ධර්‍මය

4) ධර්‍මය , සත්‍ය , කාසිය , මිත්‍රයා

10. උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

1) ගැහැනියක , මිනිසෙක් , ඔවුහු , ළමයා

2) සත්තු , ඔවුහු , කාන්තාවක් , ඇතෙක්

3) ගැහැනියක , තෝ , සොරෙක් , මා

4) තා , මිනිසුන් , අප , සමහරෙකු

11. පෙර පදයේ පමණක් අර්ථය දක්වන යුගල පද ඇතුළත් පද පේළිය තෝරන්න.

1) අඩු-පාඩු , අලි-ඇත්තු , අඟර-දඟර

2) ගනු-දෙනු , කෑම-බීම , ඇත-මෑත

3) උදවු-පදවු , පඩි-නඩි , අස්-පරස්

4) අනම්-මනම් , වං-හුං , අන්දුන්-කුන්දුන්

12. උපසර්ග පදයක් රහිත පදයක් ඇති වරණය තෝරන්න.

1) ප්‍රබල , සුදන , නිරෝගී , කුසලතා

2) කුමන්ත්‍රණ , අභිමතය , සුවිසල් , දුර්ජන

3) පරාජය , ප්‍රත්‍යක්ෂ , සංවත්සර , නිර්දෝෂ

4) අකුසල් , දුදන , කුකවි , අනුනායක

13. මිනිසුන්ගේ යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කළ විට නිවැරදිව දැක්වෙන්නේ කෙසේද?

1) මිනිසා + උන්ගේ 2) මිනිස් +උන්ගේ

3) මිනිස්සු + උන්ගේ 4) මිනිසුන් + ගේ

❖ අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

14. එකෙණෙහි බුදුන්ගේ ආනුභාවයෙන් පොළොව **කුඹල් සකක්** සේ පෙරළී උන් වහන්සේ පසුකොට බුදුන් වහන්සේ පළමු කෙළේය.

1) කළ ගෙඩියක් සේ 2) සකපෝරුවක් සේ

3) කුඹලක් සේ 4) පෝරුවක් සේ

15. නූතන සාහිත්‍යකරුවා උත්සාහ ගන්නේ **ධ්වනි පූර්ණ** යෙදුම් මගින් චමත්කාරය දැනවීමටයි.

1) මනා ව පෝෂණය වු 2) පුදුම උපදවන

3) සැඟවුණු අර්ථයන්ගෙන් පෝෂණය වු 4) මතුපිට අර්ථ සහිත

16. '**සබවස** කැලුණු මෙත් මුදිතා දහම් සැම '

1) සත්‍ය වචන 2) කරුණාව

3) මෛත්‍රිය 4) ආදරය

17. මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදයක් සහිත උත්තරය තෝරන්න.

1) කෘදන්ත - රැඟුම් , සිඟිති , හිඟමන් , බැලුම්

2) නිපාත - සහ , බඳු , එව් , වඩා

3) උපසර්ග - සුසිනිඳු , අපකීර්තිය , විගමන , උද්ගත

4) තද්ධිත - චපලතා , සෞන්දර්ය , නාගරික , දාරුමය

18. එක් එක් පේළිවල දී ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

1) සඳ - තරුපති , මව - ජනනී , උවම් - රූපක,

2) ආප්ත - වැඩිහිටි , උදක - ජලය , සතුරු - පිළිමල්

3) විලිකුන් - ඉදුණු , අර්චනීය - පිදිය යුතු , අගල - ඉර

4) අප්‍රතිහත - අප්‍රමාණ , ආයාස - නිරායාස , මාගම - ස්ත්‍රිය

19. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

1) පාපිෂ්ඨ - ධර්මිෂ්ඨ 2) ආගමන - විගමන

3) වර්ධනය - අභිවර්ධනය 4) වෛකල්පිත - අනිවාර්ය

20. වැරදි අදහස සහිත වරණය තෝරන්න.

1) කර්මකාරක වාක්‍යයක කර්මය උක්ත වන නිසා එම උක්ත කර්මයට අනුව ආඛ්‍යාතය යෙදිය යුතුය.

2) නිපාත හා උපසර්ග අව්‍ය පද ලෙස සැලකේ.

3) සියලුම ස්වර ශබ්ද ඝෝෂ ගණයට අයත්ය.

4) නාම පදයක් සෑදීමට මුල්වන කොටස ධාතු ප්‍රකෘතිය ලෙස හැඳින්වේ.

21. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1) සිරිකත - පියුමම්බා , පියුම්කලි , ශ්‍රී කාන්තා , පියුම’ ඔ,

2) සොම්නස - අමොද , තුටු , තොස් , නදන්

3) කුද - උලිඳු , කලාපති , සොමි , හිමකර

4) බුදුරද - දසබල , තිලොවග , මනබඹ , තිලෝගුරු

22. සූර්යයා අරුණලු විහිදුවද්දී නංගි මිදුලට බැස සතුටින් සිනා සිසී රෝස පඳුර දෙසට ගියාය.

1) අසම්භාව්‍ය ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා , අවසාන ක්‍රියා

2) පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා , අවසාන ක්‍රියා

3) මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , අවසාන ක්‍රියා

4) අසම්භාව්‍ය ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා , අවසාන ක්‍රියා

23. සෑම පදයකම ඌෂ්මාක්ෂරයක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

1) සරණ , බලන , බලය , කෝෂය

2) කියන , විවර , සුවය , හරය

3) සුවඳ , පක්ෂය , හතුරු , ශක්ති

4) ශරීර , ලක්ෂණ , මිතුරු , සුනිල

24. පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි නගර නාමය ඇතුළත් වරණය තෝරන්න.

1) රාපුනුඅරාධය

2) ණෑරුකුලග

3) ඔුපියටිඇලි

4) ටහම්බිතොන්

25. දී ඇති සියලුම පද නිවැරදිව විසන්ධි කර නැති පද පේළිය තෝරන්න.

1) දෙ+ඇල , මාර්ග+උපදේශ , ධන+ඊශ්වර

2) සුර+අත , ගෙන+ආවා , දින + ඉසුරු

3) විස් + කම් , කම් + හල , ඇත්+හල

4) දෙ+උර , කටු+අල , නො+ එක්

- අංක 26-27 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න

26. නියම වැඩය නියම කලට සිදුකිරීම

1) කටුස්සාගේ කරේ රන් පැළඳවීම

2) දඹුලු ගොස් තලගොයි මැරීම

3) උපාසක බළලුන් මීයන් ඇල්ලීම

4) කල දුටු කල වළ ඉහ ගැනීම

27. හේතුවක් නැතිව යමක් සිදු නොවීම

1) දී කිරට බළල්ලුන් සාක්කිලු. 2) කළුවා මාරපන ගියා වගේ

3) ගින්නක් නැතිව දුමක් නොනගී 4) ගිලීමලෙත් ඇත දත සුද්දෝ

28. A - ගුරුතුමා සිසුන් ____________ පන්ති කාමරයට ගියේය.

B - හිරු ___________ දිනකර ලෝකය එකලු කරයි.

C - ඈ සුරඟනක __________________ සුන්දරය.

D - ඔවුහු දහම් _________ නසති.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

E හෙවත් , F කැටුව , G නො , H මෙන්

1) F , G , H , E 2) F , E , H , G

3) F , H , E , G 4) H , G , E , F

❖ අංක 29 , 30 , 31 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍යය තෝරන්න.

29. 1) සියලු මිනිස්සු සත්‍යගරුක වීම මැනවි. 2) ඕ තොමෝ ගී ගයති.

3) මිනිසුන් අවංක නොවන්නේ ඇයි ? 4) අපි සමගියෙන් ජීවත් විය යුතුය.

30. 1) මව විසින් දරුවන් රැකෙති. 2) ඇමතිතුමා නව පුස්තකාලය විවෘත කළේය.

3) මල්ලී ද තෝ ද මම ද ගමට යමි. 4) ගොවියෝ කුඹුරු කොටා වි.

31. 1) ළමයින් ක්‍රීඩා කරති 'යි ගුරුවරු සිතති. 2) සුළඟින් ගස්වැල් ඉදිරී වැටෙති.

3) කුකුළෝ හඬලද්දී මම ගෙදරින් පිට වුණෙමි 4) මැණියන් දෑ දරුවෝ සනසන දෑය.

32. රූපකයක් සහිත වරණය වන්නේ ,

1) විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල 2) නරමුල් ඇඟ ඇට කිඹුලකු වැන්නේ

3) සින්ධුපමාන වැව් තලා මතින් ඇදී 4) කරපුද වදින රැඳි මුනි සිරිපා තඹර

33. 'හොඳයි , මම ඒ ගැන කල්පනා කරල තීන්දුව දෙනව තව ටිකකින් මේ අතින් නඩුව ඉවර වුණාම'

මේ සංවාද කණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක්ද ?

1) හුණු වටයේ කතාව 2) ගුරු තරුව 3) සිංහබාහු 4) මනමේ

34. 'බලය' යන පදයේ අතීත කාල ප්‍රථම පුරුෂ කර්ම කාරක ඒක වචන ක්‍රියා පදය වන්නේ

1) බැලෙයි 2) බැලුවේය 3) බලන්නේය 4) බැලිණි

35. 'උදුල සොමි කැලුම් තිසයුරු හිමි පුවළ'

1) සෞම්‍ය , බබළන , කාන්තිය , චන්ද්‍රයා 2 ) බබළන , සෞම්‍ය , කාන්තිය , චන්ද්‍රයා

3) චන්ද්‍රයා , සෞම්‍ය , කාන්තිය , බබළන 4) කාන්තිය , සෞම්‍ය , බබළන , චන්ද්‍රයා

36. ‘තොරොක්කෝව’ කෙටි කතාවේ රචකයා වන්නේ

1) හෙන්රි ජයසේන මහතාය　　2) ර්යුනොසුකෙ අකුතගාවා මහතාය

3) ඇරැව්වල නන්දිමිත්‍ර මහතාය　　4) කේ ජයතිලක මහතාය

37. හේන් ගිනි ලෑමෙන් පසු ලැබෙන ප්‍රථම වර්ෂාව හඳුන්වන්නේ

1) මොර සුරන වැස්ස ලෙසය　　2) අක්වැස්ස ලෙසය

3) මල් වැස්ස ලෙසය　　4) නා කපන වැස්ස ලෙසය

38. ‘සකපෝරුව ’ හා සම්බන්ධ කර්මාන්තය වන්නේ

1) පතල් කර්මාන්තය　　2) ධීවර කර්මාන්තය

3) මැටි කර්මාන්තය　　4) බතික් කර්මාන්තය

39. පහත සඳහන් කවියේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

වනත් නොයෙක් ගං හෝ ඇළ කඳුරු　පැන
මහත් ගැඹුරු සිඳු නොයනෙම් වෙරළ පැන
ලදත් මෙමුළු දඹදිව රජසිරි　සුදන
සිරිත් ලෙසට පවත් උඩඟු　නොවමින

1) වනයේ ඇති නොයෙක් ජලාශ මුහුද වෙරළ ඉක්මවා නොයයි

2) නොයෙක් ජලාශවල ජලය මහ මුහුදට පැමිණියත් , එම ජලය වෙරළ ඉක්මවා නොයන්නා වගේ යහපත් කෙනෙක් මුළු දඹදිව රජවුවත් අහංකාර නොවේ.

3) යහපත් මිනිස්සු රජසැප ලැබුණත් මුහුදු දිය මෙන් සිටිති.

4) උඩඟු නොවීම දඹදිව රජවරුන්ගේ සිරිතකි.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

මිනිසා විසින් සොයා ගන්නා ලද නවීන තාක්ෂණික මෙවලම් මිනිසාගේ යහපත වෙනුවෙන් යොදා ගත යුතු වුවද වර්තමානයේ සිදු වී ඇත්තේ එය මිනිසාගේ අයහපතට හේතු වී ඇති බවකි.

1) වර්තමානයේ භාවිතයට ගන්නා බොහෝ තාක්ෂණික උපකරණ මිනිසාට නුසුදුසුය.

2) නවීන තාක්ෂණික මෙවලම් මිනිසාට හිතකර ලෙස භාවිත කළ යුතුය.

3) මිනිසාගේ යහපත උදෙසා නවීන තාක්ෂණික උපකරණ යොදා ගත හැකි වුවද , අද එය මිනිසාට අයහපත උදා කර ඇති බව පෙනේ.

4) නවීන තාක්ෂණික මෙවලම් භාවිතය පහසු වුවත් විවිධ අපහසුතා ද මතු වී ඇත.

1 පත්‍රය - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 3 | 21 | 4 | 31 | 1 |
| 2 | 1 | 12 | 1 | 22 | 1 | 32 | 4 |
| 3 | 3 | 13 | 2 | 23 | 3 | 33 | 1 |
| 4 | 1 | 14 | 2 | 24 | 2 | 34 | 4 |
| 5 | 2 | 15 | 3 | 25 | 2 | 35 | 2 |
| 6 | 2 | 16 | 1 | 26 | 4 | 36 | 2 |
| 7 | 2 | 17 | 2 | 27 | 3 | 37 | 2 |
| 8 | 1 | 18 | 1 | 28 | 2 | 38 | 3 |
| 9 | 2 | 19 | 3 | 29 | 3 | 39 | 2 |
| 10 | 3 | 20 | 4 | 30 | 2 | 40 | 3 |